00057

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2018/2019

අවසාන පරීක්ෂණය - 2019

සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් - ESU~~3327~~ 3231/STU5531

කාලය : පැය තුනයි.

---

දිනය - 2019.02.18 | වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලටද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 'සෞන්දර්ය හැඟීම් සහ භාවයන් ආශ්‍රිත සංකල්පයකි.'

    නිර්වචන දෙකක් (02) ඇසුරින් අර්ථ දක්වන්න.

02. රස නිෂ්පත්තියට අදාළ ස්ථායිභාව සහ ඒවාට අනුරූප රස මොනවාදැයි පැහැදිලි කරන්න.

03. වෙනත් විෂයන් හා සමගාමීව සෞන්දර්ය විෂය ඉගෙන ගැනීමෙන් ශිෂ්‍යයා ලබන සුවිශේෂී ප්‍රතිලාභ පහක් (05) සාකච්ඡා කරන්න.

04. "සෞන්දර්ය, විටෙක පොදු කලාවකි." නාට්‍ය හා රංගකලාව උගන්වන ගුරුවරයෙක් ලෙස එය උදාහරණ පහක් (05) මඟින් සනාථ කරන්න.

05. ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන් සඳහා යොදාගත හැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පහක් (05) විස්තර කරන්න.

06. "ශිෂ්‍යයන්ගේ අධි ප්‍රජානන මානසික කුසලතා සංවර්ධනයට සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් දායක කරගත හැකි ය."

    (i) අධි ප්‍රජානන මානසික කුසලතා තුනක් (03) නම් කරන්න.

(ii) එම කුසලතා සංවර්ධනය කිරීමට යොදාගත හැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තුනක් **(03)** පෙන්වා දෙන්න.

07. කතන්දර කියාදීම ශිෂ්‍යයන්ගේ පරිකල්පන හැකියාව සංවර්ධනය කළහැකි ඉගැන්වීමේ ක්‍රමයක් වශයෙන් එහි ලක්ෂණ හතරක් **(04)** පැහැදිලි කරන්න.

08. අවුරුදු (3-4) දක්වා වයස් සීමාවට අයත් ළමා චිත්‍ර සංවර්ධන අවධිය නම් කොට එහි ලක්ෂණ හතරක් **(04)** දක්වන්න.

**(ලකුණු 5 x 8 = 40)**

## <u>2 වන කොටස</u>

09. (i) බහුවිධ බුද්ධි න්‍යායේ බුද්ධි වර්ග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 08)

(ii) නාට්‍ය හා රංගකලාව හදාරණ සිසුන් තුළ වැඩි නැඹුරුවක් සහිත බුද්ධි වර්ග තුනක් **(03)** නම් කර, ඒවා සංවර්ධනය සඳහා ගුරුවරයෙක් ලෙස කළ හැකි ක්‍රියාකාරකම් පහක් **(05)** විස්තර කරන්න. (ලකුණු 12)

10. සෞන්දර්ය අධ්‍යාපනය තුළින් ශිෂ්‍යයෙකුගේ චර්යාව විවිධාකාරයෙන් සංවර්ධනය කළ හැකිය.

(i) එලෙස චර්යාව සංවර්ධනය කළ හැකි ක්ෂේත්‍ර පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) එහිලා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් වඩාත් සංවර්ධනය වන ක්ෂේත්‍රය නම් කොට එසේ වීමට හේතු හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) භාවමය බුද්ධිය යනු කවරේදැයි පැහදිලිකොට එහි ප්‍රධාන ලක්ෂණ හතරක් **(04)** විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) නාට්‍ය හා රංගකලා ගුරුවරයකු ලෙස භාවමය බුද්ධිය සංවර්ධනය සඳහා යොදාගත හැකි අභ්‍යාස පහක් **(05)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. **(i)** ශිෂ්‍යයකුගේ පූර්ණ පෞරුෂ සංවර්ධනය සඳහා සෞන්දර්ය අධ්‍යාපනය යොදාගත හැකි ආකාරය කරුණු **පහක් (05)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

**(ii)** නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුට සෑම සෞන්දර්ය විෂයක් පිළිබඳවම ප්‍රායෝගික දැනුමක් පැවතීමේ වැදගත්කම කරුණු **පහක් (05)** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

13. **(i)** ළමා චිත්‍ර කලාව සහ වැඩිහිටි චිත්‍ර කලාව එකිනෙකට වෙනස් ය. ලක්ෂණ **පහක් (05)** ඇසුරින් සසඳන්න. (ලකුණු 10)

**(ii)** ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය සඳහා චිත්‍ර කලාව යොදාගත හැකි ආකාරය උදාහරණ **පහක් (05)** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.